**14 වන පිටෙන්**

වහා මිදුලට පැන කෑ ගසා කතා කළේ කරුණාවති පොඩි අම්මාට ය.

''බලපන් මහතුන් අයියා ඉන්නවද කියල. ඉන්නව නං ඉක්මනින් එන්න කියාපන්'' යනුවෙන් අම්මා කළ විධානයට අනුව මා හිටිවන ම උඩ විසි වී දුවගෙන ගියේ උඩහ ගෙදරට ය. මා එහි යන විට මාමා ග්‍රෑම්පෝන් තැටියකට සවන් දෙමින් සිටියේ ය.

''ආතා ලෙඩ වෙලා. අපේ ගෙදර. අම්මා ඉක්මනට එන්න කීව'' මගේ කීම අවසන් වන්නටත් කලින් ග්‍රෑමපෝනය තිබූ අයුරින් ම තිබෙන්නට හැර මාමා දුවගෙන ආවේ අපේ ගෙදරට ය. මාමා යනවිට කරුණාවති පොඩි අම්මා ආතාගේ මුහුණට වීදුරුවකින් වතුර ඉසිමින් සිටියේ අඬමින් ය.

ආතා පුටුවේ ඇල වී අසනීපයෙන් ගැහෙන ආකාරය බලා සිටි මාමා ඇසුවේ ''මොනවද කෑවෙ?'' යනුවෙන් ය.

''තේ ටිකක් ඉල්ලුව. පස්සෙ බත් උයල ඉවර හින්ද බත් ඩිංගක් කන්න දුන්න.'' අම්මා කීවා ය.

''මොනවත් එක්කද කෑවෙ?'' මාමාගේ විමසීම ය.
''අලයි කරෝල හොදියි.''
''මොන අලද?''

අල අල කඩෙන් ගෙනාපු අල. අල ගෙඩි දෙකක් තිබ්ල ඒක පොඩ්ඩ හින්ද ගෙදර තිබුණු ගහල අලයකුත් දාල ඉව්වෙ''

''හරිනෙ. ඔහොම හිටපල්ල.'' කියූ මාමා ගෙදරට හයියෙන්හයියෙන් දුව ගොස් කිසියම් වූ බෙහෙතක් ගෙනැවිත් ආතාට පෙව්වේ ය. ගත වූයේ සුළු මොහොතකි. ආතා ඇස් ඇර බැලුවේ ය. ඇස් දෙපසට විහිදා බැලුවේ ය. කඳ යන්තම් කෙළින් කොට ගත්තේ ය. අත්දෙක පුටුවත් දෙපස තබා බර දී නැගිට්ටේ ය. අම්මාගේ බියපත් මුහුණ දෙස කෙළින් ම බලා සිටියේ ය.

''පොඃ මේකි මාව මරන්න කන්න දීල තියෙන්නෙ.'' යනුවෙන් පවසා එළියට බැස පිටත්ව ගියේ බැණබැණ ය. ආතාට දැන් සනීප ය. මාමා ට හිනා ය. අම්මා බයේ වෙවුලයි.

''තාත්තට කිරිඅල විසයි. ඒව කෑවොත් ඔහොම තමයි.'' මාමා අම්මා අස්වැසුවේ ය.

ගමේ ඕනෑම වැදගත් අවස්ථාවක උදව් කිරීම සඳහා අනාරාධනයෙන් පැමිණීම ලිහිනිස් ආතාගේ විශේෂ ගුණයක් වේ. කරදරයක් වුණු විටක දී ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය උපකාරයක් කර දීම මෙන් ම ක්‍රියාකාරී වීම මහා දක්ෂ ලෙස සිදු කරයි. කෙනෙකුට අසනීපයක් හැදුණු විටක එතනට දුවගෙන යන්නේ එය තමාගේ කාර්යයක් හා යුතුකමක් හැටියට සලකා ය. අවශ්‍ය ඕනෑම දෙයකට මුලින් ම ඉදිරිපත් වන්නේ ලිහිනිස් ආතා ය. කැලෑ කොළ හොයන්නට ඒවා කොටන්නට ලෙඩාට පොවන්නට, අවශ්‍ය වුවහොත් ලෙඩාව ඔසවාගෙන වෙද ගෙදරට දුවන්නට වුව ද ඔහු සූදානම් ය. එම කාර්යයට කිසි බේදයක් නැත. සමහර විටක තමා සමඟ අමනාපයෙන් සිටින අයෙකුගේ වුව ද ලෙඩක් දුකක් කරදරයක් වුණු විට ඔහු එතැන ය.

තේ කහට බීමට රුසියෙකි. එවකට තිබුණු බෙලෙක් කෝප්පය යනුවෙන් අප හැඳින් වූ තරමක් ලොකු කෝප්පෙන් උණුඋණු තේ වතුර භාජනය, අල්ලට දමා ගත් සීනි චුට්ටක් සමඟ බොන්නේ ගිනි රස්නෙ පිට ම ය. තේ කෝප්පය ළඟට මුහුණ කිට්ටු කර දෙතොල උල් කොට එම තේ උගුර උඩට අදින ශබ්දය තරමක් දුරට වුව ද හොඳින් ඇසේ.

අහලපහළ තමන්ගේ ඥාති නිවසකට ගොස්" මට තේ උගුරක් දියන් කෙල්ලෙ" යනුවෙන් පවසමින් ඉඳගත් සැණින් ම තේ කෝප්පයක් ලැබිය යුතු ය. විනාඩියක් දෙකක් බලා සිට කේන්තියෙන් නැගිට " මං යනව" යනුවෙන් පවසා එළියට බැස පිටත් වූවාට පසු ආපසු ගෙන්නා ගැනීමට කිසිවකුට නොහැකි ය.

තමා කළ පැරණි හපන්කම් රස කරමින් කියනා විට අසා ඉන්නට ඉතා ප්‍රියජනක ය. ඔහු නොකරපු දෙයක් නැත. නොකළ චන්ඩිකමක් නැත. නොගිය පාරක් නැත. නොදන්නා ගමක්තොටක්, ගෙයක්දොරක් නැත. කිසිවෙකුට බයත් නැත.

''ඔන්න බොලල්ලා කොල්ලනෙ. ඒ කාලෙ මං නැඩය. හොඳ උහමහත. දැන් වගේ නෙමේ. ඕනෙ එහෙකට ගාය තියෙනව. නාහෙට අහන් නෑ. අපේ මායිය කැන්දගෙන ආපු අලුත. ඒ කාලෙ මං නාගහදොළ පැත්තෙ කැලෑ ගස් කපන්න උදේ ගියහම හවස් වෙනකල් මහ වනාන්තරේ. නාගහදොළේ, ගවරගිරියෙ, නිග්ගහ කැලේ ගස් කපල පහුරු බඳින්න අපි හතර පස් දෙනෙක් ලෑස්ති වෙලා හිටිය. හවහට වැඩ ඉවරවෙල නා කියාගෙන හොඳවයින් රා පොල් කටු දෙක තුනකුත් ඇද බාල කොහොම හරි මහ කළුවර වැටෙන්න ඉස්සෙල්ල එනව ගෙදෙට්ට. උඹල අහගෙනද ඉන්නෙ? ඔන්න බං එක දවසක් වැඩ ඉවර වෙන්නත් කලියෙන් වහින්න පටන් ගත්ත එක සීරුවට. අනෝරා වැස්ස. අපි තුන් හතර දෙනා නාල, රා ඩිංගක් හෙම සප්පායම් වෙලා හිටිය වැස්ස ටිකක් තුරල් වෙනකං. කෝ මොන තුරල් කෙරිල්ලක්ද. මයෙ හිතේ රෑ නවයත් පහු වෙන්න ඇති යංතං පොදේ කැඩෙන කොට.

''සරහට තියල බැලුව. මෙන්න ඒකා දුවන්න ගත්තෙ නැතෑ. මාත් අතෑරියෙ නෑ. මට බයේනෙ දුවන්නෙ කියල හිතුණා. ඉතින් මං මොකොටොද බය වෙන්නෙ. මාත් පස්සෙන් හයියෙන් හයියෙං ගිහිල්ල ළඟට ම ගියා. මං කිට්ටු කරල බැලින්නං. මොකද දන්නවද වෙලා තියෙන්නෙ. කලින් දවසෙ තොවිල් ගෙදරකින් ගෙනත් දාල තිබුණු මල් බුලත් තටුවක් කළු හරකකුගෙ අං දෙකේ පැටලිල. ඌට ඒක ගලව ගන්න බැරුව එහෙ මෙහෙ යනව. යංතං හඳ එළියට දිලිසෙන අර ගොක්කොළ කෙහෙල් පතුරු තමයි මං ඇට සැකිලි වගේ දැකල තියෙන්නෙ. ඔහෙ හිටු ගෙරිය කියල උගෙ ඉස්සරහට පැනල තටුව අඟෙන් ගලවල දාල පිටට පාරක් දීල පන්නල මං ආව ගෙදර.'' ලිහිනිස් ආතා මහා හයියෙන් හිනාවුණෙ ''ඕව ඔය හොල්මන් කියන්නෙ පට්ට පල් බොරු'' කියාගෙන ය. අපේ හිරිගඩු පිපී තිබුණු ඇගේ මයිල් නිවී පහත් වූයේ ඉන් පසුව ය.

**ඒ එනකොට මට පේනව යකෝ ඈතින් හුදු පාටට කවුද එනව වගේ. ටිකක් ඒ දිහා බලං හිටිය. ඇස් හෙම ටිකක් පාදල බැලුවහම මෙන්න හත්තිලව්වෙ ඒ එන්නෙ ඇට සැකිල්ලක් නෙ. ඔය නුගේ හරියෙ හොල්මන් අවතාර තියෙනව කියලත් කියන හින්ද මගේ හිතත් ටිකක් ගැස්සුණා.**

අනිත් ඈයො කීවත් මට රෑට වාඩියෙම නැවතිල හෙටත් වැඩ කරල ම යන්න කියල, මට හිත දුන්නෙම නෑ ගෙදර එකී තනියෙං තියල එහේ නවතින්න. උන්දැ ඇවිල්ලත් වැඩි දවසක් නෑනෙ බොලල්ල. හනසු ටිකක් පත්තු කරගෙන බැස්ස අඩි පාරට. හයියෙන්හයියෙන් ඇහිල්ල ඔන්න යටගම්පිටියට ආවයි කියමුකො.

යන්තං හඳත් පායල. පාහිංගල ගල් පරුවතේ මහා උහට හඳ එළියට පේනව. ඒ දිහාත් පොඩ්ඩක් බලාගෙන ඉඳල ඇල වේලි දිගේ එන්න ගත්ත ගෙදෙට්ට එන්න. ඔන්න පන්දමත් නිවුණෙ නැතෑ. යංතං හිත් හෝදිසියට වගේ අඩි පාර පේනව. මං ආව අඩි පාර දිගේ ම කුකුලෑල මහ නුගේ ළඟට. ඒ එනකොට මට පේනව යකෝ ඈතින් හුදු පාටට කවුද එනව වගේ. ටිකක් ඒ දිහා බලං හිටිය. ඇස් හෙම ටිකක් පාදල බැලුවහම මෙන්න හත්තිලව්වෙ ඒ එන්නෙ ඇට සැකිල්ලක් නෙ. ඔය නුගේ හරියෙ හොල්මන් අවතාර තියෙනව කියලත් කියන හින්ද මගේ හිතත් ටිකක් ගැස්සුණා. මොටෝ බොරු කියන්නෙ. හැබැයි මං බය උනෙ නෑ. ඔන්න මං බලන් ඉන්නව ඇට සැකිල්ල ඩිංග ඩිංග මයෙ පැත්තට එනව. කරේ තිබුණ පොරව ආව අතට. අත් දෙකෙන් ම පොරව අල්ල ගත්ත හයියෙන් ම. හිතට දයිරිය අරං බලං හිටිය. දැන් ඇට සැකිල්ල පැද්දිපැද්දි හෙල්ලි හෙල්ලි මයෙ ඉසරහට එනව. මං ආවොත් පොරෝ පාර දෙන්නං කියල හිටි අඩියෙ ම හිටිය. ඔන්න ඒකා මාව දැක්ක. නැවතුණා. පැත්තකට හැරුණා. යන්න ගත්තෙ නැතෑ හැරිච්ච පැත්තට. මගේ බයත් ඩිංගක් අඩු වුණායි කියමුකො. දැන් ඒකා වේල්ලක් දිගේ හයියෙන් හයියෙන් යනව. මට පේනව කළු පාටට දිගට දිගේ මොකක්ද ඇදගෙන යනව වගේ. මමත් අඩියක් දෙකක් ඉසරහට තියල බැලුව. ...

කරන්නට වෙනයම් විශේෂ දෙයක් නොමැති විට ලිහිනිස් ආතා අතුරේ ඇල්බට් මුදලාලිගේ කඩේ සිටිනවා දැකිය හැකි ය.

මා සහ ගුණපාල මල්ලී අතුරේ ඩිස්පෙන්සරියෙන් බඩ විරේකය සඳහා බෙහෙත් බීම පිණිස මාස දෙකකට පමණ නොවරදවා යන ගමනකි. ගමේ පිරිස කට වහරෙට ''සින්නපොඩියෙන්'' යනුවෙන් හඳුන්වනු ලබන බෙහෙත් වර්ගය බෙහෙත් කළවම් කරන කෙනා පුංචි ඇලුමිනියම් කෝප්පයකට දමා බීමට දෙයි. කිසියම් වූ ලා කිරි පාට වතුරකට බෙහෙත් කුප්පියකින් බින්දු කිහිපයක් දමා දෙන මෙම බෙහෙත බීම ඉතා ම අප්‍රසන්න ය. යළියළි උගුරට එන නිසා අපි බෙහෙත් බීමට යන විට බුලත් කොළයක් ගෙන යාමට අමතක නොකරමු. බෙහෙත් බීමට උදයේ හිස් බඩ ම යා යුතුය.

එක් දිනක ගුණපාල මල්ලීත් මමත් බෙහෙත් බීම සඳහා අතුරේ ඩිස්පෙන්සරියට ගියෙමු. එවකට ඩිසපෙන්සරිය තිබුණේ මහා විද්‍යාලයට හැරෙන මාර්ගයට ඉහළින් අද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පවතින ස්ථානයේ ය. බෙහෙත් බී ආපසු එන විට අතුරේ සොහොන් භූමිය අසල දී මට දැනුණු ක්ලාන්ත ගතිය නිසා බිම ඉඳගෙන බිමට ඇල වූයෙමි. ගුණපාල මල්ලීත් අඬන්නට පටන් ගත් අතර එතැනින් ගිය ඇල්බට් මුදලාලිගේ අයියා දුවගෙන ගොස්, සිද්ධිය කඩයේ සිටි ලිහිනිස් ආතාට දන්වා ඇත. ආරංචිය කන වැටුණු විගස ම දුවගෙන විත් කිසිවකුගෙන් කිසිවක් නොවිමසා ඇල වී සිටි මා ඔසවා කරට ගෙන සැතපුම් තුන් කාලකට වඩා වැඩි දුරක ඇති ගෙදරට ගෙන ගොස් ඇඳ උඩින් තබා ''මේ කොලුවට කන්න මොනා හරි දීපල්ලා. උදේ හිස් බඩ ම යවනවා පොඩි එවුන්ව බේත් බොන්න.'' ගෙදර අයට ගෝරනාඩු කර ආපසු ගිය අයුරු අදත් මා සිහිපත් කරන්නේ ගෞරවයෙනි.




# හොරණ

## ඉඩමක් හා නිවස විකිණීමට

හොරණ නගරයට ආසන්න
සියළු පහසුකම් සහිත
පර්චස් 20ක ඉඩමක් හා නිවස
විකිණීමට තිබේ.
විස්තර සඳහා අමතන්න 0411 421 227

# TILING

**All kinds of TILING works**

Including-
*Paving / stepping stones,
*Waterproofing (Indoor and Outdoor),
*Landscaping,
*Retaining Walls,
*Caulking (Silicon finish)

**No job too small or big**

Contact
**THIMIRA (TIM) 0401975648**